TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

No. 5/1, Elibank Road, Colombo 05, Sri Lanka
Tele : (94) 11 4369781, 11 4369782, 11 4369783
Fax : (94) 11 2 501 707
Email : tisl@tisrilanka.org
Web: www.tisrilanka.org

පොදු දේපල සුරැකීමේ වැඩසටහන,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
5/1 , එලිබෑන්ක් පාර , කොළඹ 05.
2019.10.19.

මහින්ද දේශප්‍රිය මහතා ,
සභාපති,
ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව,
රාජගිරිය.

මහත්මයාණෙනි,

<u>රජයේ මුදල් වැය කරමින් පවත්වනු ලැබූ මුල් ගල් තැබීමේ උත්සවයක් සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා</u>

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂකයන් විසින් 2019.10.04 වන දින ස්වාධීන රූපවාහිනී සේවයේ දිවා ප්‍රවෘත්ති විකාශය නිරීක්ෂණය කිරීමේ දි වාර්තා වූයේ "විට්ස්වයික් බහු කාර්යය මධ්‍යස්ථානය" ගොඩනැගීම සඳහා මෝදර දී සංවිධානය කරන ලද මුල් ගල් තැබීමේ උත්සවය අතරතුර දි ඊට සහභාගී වූ අමාත්‍ය රවී කරුණානායක මහතා සහ කොළඹ නගරාධිපතිනි වන රෝසි සේනානායක මහත්මිය විසින් 2019.10.03 දින නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණේ ජනාධිපති අපේක්ෂකවරයා ප්‍රවර්ධනය වන ආකාරයෙන් ප්‍රකාශ සිදු කර ඇති බවයි. මේ සමඟ එයට අදාළ වීඩියෝ පටය complaint.pre2019@elections.gov.lk යන ඊමේල් ලිපිනයට එවා ඇත.

2019 සැප්තැම්බර් 19 අංක 2141/52 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ අංක 3(i) නියමය අනුව ඉහත ආකාරයේ දේශපාලන ප්‍රවර්ධන කටයුතු සිදු කිරීම නීති විරෝධී බැවින් මෙම කරුණ සම්බන්ධයෙන් වැඩිදුරටත් සොයා බලා අවශ්‍ය වන්නේ නම් නිසි පියවර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.


මේ සම්බන්ධයෙන් වැඩිදුර තොරතුරු දැන ගැනීම සඳහා බස්නාහිර පළාත් සම්බන්ධීකාරක සංචි අමා මෙනවිය හෝ ජාතික සම්බන්ධීකාරක ලක්විජය බණ්ඩාර මහතා 076 322 344 2 / 076 322 366 2 යන දුරකථන අංක ඔස්සේ සම්බන්ධ කර ගන්නා මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.


ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය(TISL) යනු දූෂණයට එරෙහි ගෝලීය ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සංවිධානයේ ස්වාධීන දේශීය ශාඛාවයි. පොදු දේපල සුරැකීමේ වැඩසටහන (PPPR), මැතිවරණ සමයේ දි පොදු දේපල අවභාවිතා වීම වැලැක්වීම සඳහා ක්‍රියාත්මක වන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ මැතිවරණ නිරීක්ෂණ වැඩසටහනයි.

ස්තුතියි.

මෙයට ,
විශ්වාසී,

Lakvijaya Bandara
..............................
ලක්විජය බණ්ඩාර.
ජාතික සම්බන්ධීකාරක. (PPPR)


ITN


ITN


ITN
බහුකාර්ය මධ්‍යස්ථානය
සඳහා මුල්ගල තැබීම